# ශ්‍රී ලංකාවේ අවිවාහකත්වය කෙරෙහි බලපාන සාධක හා එහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ජේ.පී.එන්.අයි. සඳමාලි [1]*

මානව ශිෂ්ටාචාරය ආරම්භයේ සිටම විවාහය හා පවුල සමාජ ව්‍යුහය නිර්මාණය කිරීමෙහිලා ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත. සමාජයක අඛණ්ඩ පැවැත්ම සඳහා මිනිසුන් අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සමාජයීය, නීතිමය වශයෙන් අනුමැතිය ලැබෙන්නේ විවාහය තුළිනි. ඒ අනුව විවාහය යනු පුද්ගල හා කාන්තාවක් අතර ශාරීරික, නීතිමය හා සමාජමය වශයෙන් ඇති කරනු ලබන සබඳතාවකටය. කාලානුරූපීව විවිධ සමාජ බලවේගවල බලපෑම නිසා විවාහ සංස්කෘතියද වෙනස් වී ඇත. වර්තමානයේ විවිධ බලවේගවල බලපෑම හේතුවෙන් විවාහ නොවීම කෙරෙහි බලපාන සාධක මොනවාද යන ගැටලුව පදනම් කරගෙන සිදුකළ මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ අවිවාහකත්වය කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමයි. ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සිදුකළ මෙම පරීක්ෂණයේ දත්ත රැස් කිරීමට අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා භාවිතා කළේය. අරමුණු සහගත නියැදි තේරීම යටතේ නියැදිය ලෙස කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වයස අවුරුදු හතලිහට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම තිස් දෙනෙකු තෝරාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා තේමා විශ්ලේෂණ ක්‍රමය යොදාගන්නා ලදී. සොයා ගැනීම් වලට අනුව විවාහ නොවීම කෙරෙහි බලපාන පුද්ගලික සාධක හා සමාජ සාධක ලෙස ප්‍රධාන වර්ග දෙකක් හඳුනාගත හැකි විය. පුද්ගලික සාධක ලෙස අධ්‍යාපනය, දරිද්‍රතාව, රෝගී තත්ව, වයස්ගත වීම ආදියද සමාජ සාධක ලෙස කුලය, දෑවැද්ද, ජාතිය, ගෝලීයකරණය ආදී නවීන සමාජ වෙනස්වීම්වල බලපෑම හඳුනාගත හැකි විය. එසේම අවිවාහකත්වය නිසා පුද්ගලයින් මානසික අවපීඩනය, කාංසාව, සමාජ හුදකලාව ආදී මානසික ආබාධවලවලදී ගොදුරු වන බව අවබෝධ විය. මෙම තත්ත්වයන් පිරිමින්ට වඩා කාන්තාවන් අතර බහුලය. අවිවාහක පුද්ගලයින්ට අදාළ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සිදුකළ යුතු බවත් එමගින් අවිවාහක පුද්ගලයන්ට සිදුවන බලපෑම අවම කිරීමටත් සමාජ ප්‍රගමනයටත් දායක විය හැකි බවත් අවබෝධ විය.

***ප්‍රමුඛ පදඃ*** පුද්ගලික සාධක, විවාහ නොවීම, සමාජ ප්‍රගමනය, සමාජ වෙනස්වීම, සමාජ සාදක

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. isurikasandamali96@gmail.com